ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය 2022/23

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය **II LLU4708**

---

දිනය – 21-03-2024 | වේලාව - පෙ.ව 9.30-ප.ව. 12.30

---

කාලය – පැය 03

මුලු ප්‍රශ්න ගණන – 08

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

(1) අමානි ඇරිස්ට්‍රියා රාජ්‍යයේ කම්කරු දෙපාර්තමේන්තුවට අනුබද්ධ විමර්ශන නිලධාරිනියකි. 2023 මාර්තු මාසයේ, අලුතින් පුරප්පාඩු වූ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා කම්කරු දෙපාර්තමේන්තුව අයදුම් පත්‍ර කැඳවීය. සාම්ප්‍රදායිකව, ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර හොබවනු ලැබුවේ පිරිමින් වුවද, තමාට ඒ සඳහා නිසි සුදුසුකම් ඇති බවට සැලකූ අමානි ඒ සඳහා ඉල්ලුම් කිරීමට තීරණය කළාය. කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කළ, උසස් වීම් පිළිබඳ රෙගුලාසිවලට අනුව, ඒ සඳහා පළමුව තරගකාරී අභ්‍යන්තර විභාගයක් ද, ඉන් ඉහළ ලකුණු ලබා ලැයිස්තුගත කෙරෙන තෝරාගත් අපේක්ෂකයන් සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් ද අවශ්‍ය වෙයි. 2023 සැප්තැම්බර් මස පැවැති විභාගයෙන් ලැයිස්තුගත වූ අපේක්ෂකයන් පස් දෙනා අතරට අමානි තේරී පත්වූවාය. පසුව පැවැති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වූ අවස්ථාවේ, එලෙස තේරී පත් වූ එකම කාන්තාව තමුන් බව අමානිට පැහැදිලි විය. සම්මුඛ පරීක්ෂණය සිදුකළ මණ්ඩලය මුලුමනින්ම සමන්විත වී තිබුණේ පිරිමි අයගෙනි. 2023 දෙසැම්බර් මස පැවැති සම්මුඛ පරීක්ෂණයේ දී, අමානි වෙත යොමු වූ ඇතැම් ප්‍රශ්න නිසා ඇය අපහසුතාවයට පත් වූවාය. එම ප්‍රශ්න සඳහා ඇතැම් උදාහරණ මෙලෙසය :

*- ඔබ විවාහකද?*

*- ඔබ නුදුරේ දරුවන් හැදීමට අදහස් කරනවාද?*

*- ඔබට ළමයි හදනවා නම්, ප්‍රසූත නිවාඩු ගැනීමට සිදු වෙනවා නේද? එවිට තනතුර තාවකාලිකව පුරප්පාඩු වෙයි නේද?*

*- කාන්තාවක ලෙස ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුරේ වගකීම් සාර්ථක ලෙස ඉසිලිය හැකි බව සිතනවාද?*

*- මේ ධුරය මීට කලින් කාන්තාවන් උසුලා නැති බව ඔබ දන්නවාද?*

2024 ජනවාරි මස සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් වූ පසුව, තමුන් අදාල නතතුර සඳහා තේරී පත් වී නොමැති බවට අමානි දැනගත්තාය. තමා කාන්තාවක වීම නිසා අයුක්ති සහගත ලෙස ප්‍රතික්ෂේප වූ බවට අමානි සලකයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම සඳහා ඇය ඔබගේ උපදෙස් පතයි. ඇරිස්ට්‍රියාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සමරූපී බව උපකල්පනය කරමින්, අදාල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හා නඩු නීතිය වෙත සැඳහුම් කරමින්, අමානිට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

(2) ජෝන් බාස් යනු ඩිමෙන්ෂියා රාජ්‍යයේ ප්‍රධාන පෙලේ ප්‍රකාශන ආයතනයක් වන රිවර්හවුස් පබ්ලිකේශනස්හි සේවය කරන මාධ්‍යවේදියෙකි. ඩිමෙන්ෂියා රාජ්‍යය අසල්වැසි ඇරිස්ට්‍රියා රාජ්‍යයේ පෞද්ගලික ඉදිකිරීම් සමාගමක් වන ඇරිස්ට්‍රියා කන්ස්ට්‍රක්ෂන්ස් ලිමිටඩ්. සමාගම සමග ගිවිසුමකට එළැඹී අතර මධ්‍යම පන්තික නාගරික නිවැසියන් සඳහා නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඉන් අදාල සමාගමට වෙත බලපත්‍ර ප්‍රදානය කෙරුණි. ඩිමෙන්ෂියාවේ අගනුවර විශාල හිස් භූමි ප්‍රදේශයක් මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීමට යෝජනා වී තිබුණු අතර මෙය දශක ගණනාවක් තිස්සේ නගරවැසියන් විසින් විවේකීව කාලය ගත කිරීම සඳහා යොදාගත් බිම් කඩකි. ගිවිසුමක් අත්සන් කොට තිබෙන බවට ආරංචි වූ විට, මෙය මහජනයාහට වැදගත් කරුණක් යැයි සිතූ ජෝන් බාස් එම ගිවිසුමේ අන්තර්ගතය පිලිබඳ තොරතුරු දැනගනීම කෙරෙහි උත්සුක විය. මෙම ගිවිසුම පිලිබඳ විමසූ විට, එහි තොරතුරු හෙලිදරව් කිරීම අන්තර්ජාතික ආර්ථික සම්බන්ධතා කෙරෙහි අහිතකර වනු ඇති බවට වූ පදනම මත, එය හෙලිකිරීම නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතික්ෂේප කළේය. මෙලෙස තොරතුරු හෙලිකිරීම ප්‍රතික්ෂේප කිරීම ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙසට ජෝන් බාස් සලකයි. ඩිමෙන්ෂියා රාජ්‍යයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සමාන බවට උපකල්පනය කරන්න. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ නෛතික ස්ථිතිය සම්බන්ධ රීතීන්වල පසුබිම තුල, ජෝන් බාස්ට මූලික අයිතිවාසිකම් නඩුකරයක් ගොනු කල හැකි පදනම් කවරේදැ'යි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(3) '[…] 'ප්‍රකාශනය ද ඇතුලත්ව, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස' ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් පිලිගනු ලැබුවා වූ මූලික අයිතිවාසිකම්වල සඳහන් ප්‍රකාශය, ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍යය යන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මුරගල සංයුක්ත කරන්නා වූ මූලික සිද්ධාන්තවල පසුබිම තුල, පළල් ලෙස අර්ථනිරූපණය කල යුතු වේ'

- ප්‍රනාන්දු විනිසුරු, කරුණාතිලක සහ තවත් අයෙක් එ. දයානන්ද දිශානායක [1999] 1 SLR 157 at 173

ඉහත ප්‍රකාශය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය අර්ථ නිරූපණය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ අධිකරණය අනුගමනය කොට තිබෙන ප්‍රවේශය පිලිබිඹු කරන බවට ඔබ සලකන්නේද? අදාල නඩු නීතිය ඇසුරින් විවේචනාත්මක විමසන්න. (ලකුණු 20)

(4) රටින් මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ අරමුණ සහිතව, තාමලේ රාජ්‍යයේ ආණ්ඩුව විශේෂ පොලිස් මෙහෙයුමක් ප්‍රකාශයට පත් කළේය. අහනාජ් යනු, තාමලේ රාජ්‍යයේ අගනුවර ජීවත් වන, තිස් හැවිරිදි ත්‍රී රෝද රථ රියැදුරෙකි. හේ අතීතයේ මත්ද්‍රව්‍ය චෝදනා සහ වෙනත් සුලු වැරදි පිලිබඳ චෝදනා උඩ රිමාන්ඩ්

7. (අ) දහතුන්වන සංශෝධනය පිළිබඳ කරුණ නඩු තීරණය තුල, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 'ඒකීය' හා 'සන්ධීය' රාජ්‍යයන් යන්නට ලබා දී තිබෙන නිර්වචනය කවරේදැ'යි විභාග කරන්න. දහ තුන් වන සංශෝධනය ඒකීය රාජ්‍යයක සීමාව තුල පවතින බව තීරණය කිරීම සඳහා මෙම නිර්වචනයන් භාවිතා වූ ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 12)

(ආ) ඒකීය හා සන්ධීය රාජ්‍යයන් අතර වෙනස පිලිබඳ උක්ත බෙදීමේ පසුබිම තුළ, (අ) සන්ධීය ව්‍යවස්ථා රාමුවක් සහ (ආ) බලය බෙදීමේ ව්‍යවස්ථාමය රාමුවක් නියෝජනය කරන, විදේශ ආණ්ඩු ක්‍රම දෙකක් තෝරාගෙන ඒවායේ මූලික ලක්ෂණ පිලිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 8)

(ලකුණු 20)

8. පහත මාතෘකා පිලිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) පළාත් රාජ්‍ය සේවය

(ආ) බලය විමධ්‍යගතකරණය සහ බලය බෙදීම

(ඇ) සමගාමී ලැයිස්තුව

(ඈ) 13 වන සංශෝධනය යටතේ ආණ්ඩුකාරවරයාගේ බලතල

(ලකුණු 20)

***